# මග්ගාධිපතිනො පදයේ ටීකා විග්‍රහය

“මග්ගො අධිපති එතෙස”න්ති - මග්ගො අධිපති එතෙසං[1]; යන මෙම; අයඤ්ච අත්ථො - මෙම බහුබ්බීහි සමාස අර්ථය ද; නික්ඛෙපකණ්ඩෙ - නික්ෂේප කාණ්ඩයේ; උදාහරණවසෙන - උදාහරණ වශයෙන් (නිදස්සනනය වශයෙන්); ආගතං - පැමිණියා වූ; අත්ථනයං - අර්ථනය; ගහෙත්වා - ගෙන; (සඞ්ගහකාරකෙන) වුත්තො - කියන ලදී. පන - සත්‍ය වශයෙන් කිවහොත්; යස්මා[2] - යම් හේතුවක් නිසා; පට්ඨානෙ - පට්ඨාන ප්‍රකරණයෙහි; (පට්ඨා· 2.16.11) “මග්ගාධිපතිං ධම්මං පටිච්ච මග්ගාධිපති ධම්මො උප්පජ්ජති නාධිපතිපච්චයා, මග්ගාධිපතී ඛන්ධෙ පටිච්ච මග්ගාධිපති අධිපතී”ති - මග්ගාධිපතිං -පෙ- අධිපති යනුවෙන්; වුත්තං - වදාරණ ලද්දේ ද (මග්ගාධිපතිං - මාර්ගය නම් වූ අධිපති ඇත්තා වූ; ධම්මං - ධර්මයන්; පටිච්ච - සහජාත වශයෙන් ගෙන; මග්ගාධිපති - මාර්ගය නම් වූ අධිපති, මාර්ගය නම් වූ අධිපති ඇත්තා වූ; ධම්මො - ධර්මය; නාධිපතිපච්චයා - අධිපති ප්‍රත්‍යය හැර සෙසු ප්‍රත්‍යයන් හේතුවෙන්; උප්පජ්ජති - උපදියි. මග්ගාධිපතී - මග්ගාධිපති වන; ඛන්ධෙ - ස්කන්ධයන්; පටිච්ච - සහජාත වශයෙන් ගෙන; මග්ගාධිපති - මාර්ගය නම් වූ අධිපති වන; අධිපති - අධිපති (ධම්මො උප්පජ්ජති)); තස්මා[3] - එබැවින්; මග්ගො - මාර්ගය නම් වූ; අධිපති - අධිපති ය; මග්ගාධිපතීති - මග්ගාධිපති යැයි; අයම්පි අත්ථො - මෙම කම්මධාර අර්ථය ද; පාළියං - ධම්මසංගණී මාතිකා පාළියෙහි; සරූපෙකසෙසවසෙන - සරූපඑකසෙස වශයෙන් ද; සමානසද්දත්ථවසෙන වා - සමාන වන ශබ්දයාගේ අර්ථ වශයෙන් ද; සඞ්ගහිතොති - සංග්‍රහ කරන ලදී යනුවෙන්; වෙදිතබ්බො - දත යුතු ය. - මූලටීකාව

---

[1] **මග්ගො අධිපති -පෙ- වුත්තො** - "මග්ගො + අධිපති + එතෙසං" යන අටුවාවෙහි පැමිණෙන බහුබ්බීහි සමාස විග්‍රහය, නික්ෂේපකාණ්ඩ පාළියෙහි උදාහරණයට අනුකූලව ඇති බහුබ්බීහි සමාස අර්ථය දැක්වීම යි. ව්‍යාකරණ ග්‍රන්ථයන්වල උදාහරණයන් ස්වල්පයක් දක්වන්නාක් මෙන් මෙම බහුබ්බීහි සමාස විග්‍රහ අර්ථය ද නිදස්සන නයෙන් දක්වන්නා වූ උදාහරණයකි. අනවශේෂ වශයෙන් දැක්වීමක් නොවේ (උදාහරණවසෙනාති නිදස්සනවසෙන. න නිරවසෙසවසෙනාති අත්ථො - අනුටීකාව). නික්ෂේප කාණ්ඩ පාළියෙහි සහජාතාධිපතිය සඳහා දක්වා ඇත්තේ වීමංසාධිපතිය පමණි. සම්මාවායාමය මාර්ගාංගයක් වෙමින් 'මග්ග' යන නාමය ලැබුව ද වීරියාධිපතිය දක්වා නොමැත.

[2] **යස්මා පන -පෙ- වුත්තං** - මෙම වාක්‍යය පට්ඨාන පාළියෙන් ගෙන හැර දක්වන්නා වූ සාධක වාක්‍යයකි. මග්ගාධිපතිං ධම්මන්ති එත්ථ බහුබ්බීහිසමාසො කාතබ්බො. මග්ගාධිපති ධම්මොති එත්ථ සමාසද්වයම්පි. තත්ථ මග්ගාධිපති අධිපතීති එතං කම්මධාරයං සන්ධාය වුත්තං. මග්ගාධිපතිං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධාති ආදි අවසෙසපදං පන මග්ගාධිපතිං සද්දස්ස බහුබ්බීහිසමාසං සන්ධාය වුත්තං - මධුටීකාව.

[3] **තස්මා -පෙ- වෙදිතබ්බං** - එම පට්ඨාන පාළියෙහි "මග්ගාධිපති අධිපති" යනුවෙන් දේශනා කරන ලද බැවින් "මග්ගො+අධිපති=මග්ගාධිපති" යන කම්මධාර සමාසය දත යුතු ය. එසේ සැළකූ විට එය මාතිකා පාළිය සමඟ කෙසේ සම්බන්ධ වේ ද යනුවෙන් පැනයක් ඇති වන බැවින් "සරූපෙකසෙසවසෙන -පෙ- වෙදිතබ්බො" යනුවෙන් දැක්වීය.

මාතිකා පාළියෙහි දී බහුබ්බීහි සම්බන්ධය දැක්වෙන මග්ගාධිපති පදය, කම්මධාර සම්බන්ධය දැක්වෙන මග්ගාධිපති පදය යන මෙම පද දෙක "මග්ගාධිපතිනො ච - මාර්ගය නම් වූ ආරම්මණාධිපති, සහජාතාධිපති ඇති ධර්මයෝ ද මග්ගාධිපතිනො ච - මාර්ගය නම් වූ අධිපති වන ධර්මයෝ ද මග්ගාධිපතිනො" යනුවෙන් එකසෙස කොට සංග්‍රහ කිරීම ද ශබ්ද සමාන භාවය හේතුවෙන් සාමඤ්ඤනිද්දෙස නයෙන් ද එම පදයන් දෙක ම සංග්‍රහ කරන ලදී යනුවෙන් දත යුතු ය.

**සාරාංශය** - දක්වන ලද මෙම ක්‍රමයට අනුව "මග්ගාධිපතිනො - මාර්ගය යන ආරම්මණාධිපති ප්‍රත්‍යය ඇත්තා වූ (මාර්ගය ම ආරම්මණාධිපති ප්‍රත්‍යය කොට ඇත්තා වූ); වා - මාර්ගය යන සහජාතාධිපති ප්‍රත්‍යය ඇත්තා වූ (මාර්ගයෙහි ම පිහිටි සහජාතාධිපති ප්‍රත්‍යය ඇති ධර්මයෝ)" යන මෙම බහුබ්බීහි සමාස අර්ථ දෙක දී ඒ සඳහා වෙන වෙන ම ස්වරූපාර්ථ දැක්විය යුතු වේ. "වා - මාර්ගය යන අධිපති වන (මාර්ගය ම සහජාතාධිපති ප්‍රත්‍යය කොට ඇත්තා වූ)" යන කම්මධාර සමාසය සඳහා තෙවන ක්‍රමයට අර්ථ දී ස්වරූපාර්ථ දැක්විය යුතු වේ. මාතිකා ස්වරූපාර්ථ කියවන්න.

## <u>මග්ගාරම්මණ ත්‍රිකයෙන් දක්වා ඇති සාධක පාඨය බෙදැ දැක්වීම</u>

බහුබ්බීහි    කම්මධාර, බහුබ්බීහි

මග්ගාධිපතිං ධම්මං පටිච්ච මග්ගාධිපති ධම්මො උප්පජ්ජති නඅධිපතිපච්චයා

මග්ගාධිපතී ඛන්ධෙ පටිච්ච මග්ගාධිපති අධිපති. මග්ගාධිපතිං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා...පෙ... ද්වෙ ඛන්ධෙ...පෙ....

කම්මධාර    බහුබ්බීහි